# පිළිසඳර
# PILISANDARA

2017
මැයි/ජූනි
npassrilanka@gmail.com

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ අධ්‍යාපන හා තොරතුරු ප්‍රකාශනය
Educational and News Bulletin of the National Photographic Art Society of Sri Lanka





**64 වන මහා සභා රැස්වීමේ නිල ආරාධනා පත්‍රය සහ න්‍යාය පත්‍රය සඳහා ඇතුලු පිට බලන්න..**

**18 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයට ඡායාරූප භාරගැනේ..**

## මහා සභාවේ දිනය ජූලි 23

මීට ඉහත පළකරන ලද පිළිසඳර මඟින් දැන්වූ පරිදි ජූලි මස 09 වන දින පැවැත්වීමට තිබූ ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 64 වන මහා සභා රැස්වීම නොවැළැක්විය හැකි හේතුවක් නිසා ජූලි මස 23 වන දිනට කල්දමන ලදී.

ඒ අනුව මහා සභා රැස්වීම ජූලි මස 23 වන ඉරුදින පෙරවරු 09 ට කොළඹ 07, මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී පැවැත්වීමට නියමිතය.

### ඇතුළු පිටු


» 64 වන වාර්ෂික මහා සභා රැස්වීම
» 18 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය - 2017
» පසුගිය 03 වන ඉරිදා කතිකාවන්
» දෙවන වසරේ හෝර්ටන් තැන්න වැඩමුළුව
» ගං දියට බිලි නොවූ මනුසත්කම
» ගොඩනැගිලි අරමුදලට අපිත් දායක වෙමු
» මාසික තරග ජයග්‍රහණ
» පිළිසඳර ඔබ අතට එන්නේ මෙහෙමයි
» චක්‍රලේඛන උපුටනයෙන් මධ්‍යස්ථාන පරිපාලන විධිවිධාන



**QD/149/NEWS/2017**

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
තැ.පෙ. 452, කොළඹ

# නිල ආරාධනා පත්‍රය

## 64 වන වාර්ෂික මහා සභා රැස්වීම

හිතවත් සාමාජික / සාමාජිකාවන් වෙත,

අප සංගමයේ 64 වන වාර්ෂික මහා සභා රැස්වීම පහත සඳහන් දින පැවැත්වීමට තීරණය කර ඇත.

| | | |
|---|---|---|
| දිනය | : | 2017 ජූලි මස 23 වැනි ඉරු දින |
| වේලාව | : | පෙරවරු 09.00 ට |
| ස්ථානය | : | කොළඹ 07, ආනන්ද කුමාරස්වාමි මාවතේ මහවැලි කේන්ද්‍ර ශ්‍රවණාගාරයේ දී |

මෙදින රැස්වීමට ඔබගේ පැමිණීම ගෞරවයෙන් යුතුව අපේක්ෂා කරමු.

*ගරු අධ්‍යක්ෂ මණ්ඩලය*

## 64 වන වාර්ෂික මහා සභා රැස්වීමේ න්‍යාය පත්‍රය

- ආමන්ත්‍රණය.
- පොල්තෙල් පහන දැල්වීම.
- ජාතික ගීය වාදනය කිරීම.
- සභාව පිළිගැනීම.
- අප අතුරින් වියෝවූ සාමාජික / සාමාජිකාවන් සිහි කිරීම.
- ලිපි කියවීම.
- පසුගිය රැස්වීමේ වාර්තාව සභාගත කිරීම සහ සභා සම්මත කිරීම.
- වාර්ෂික ප්‍රගති වාර්තාව ඉදිරිපත් කිරීම.
- වාර්ෂික අයවැය වාර්තාව ඉදිරිපත් කිරීම සහ සභා සම්මත කිරීම.
- අධ්‍යක්ෂ මණ්ඩලය ඉල්ලා අස්වීම.
- තාවකාලික සභාපතිවරයෙකු පත්කිරීම.
- තාවකාලික ලේකම්වරයෙකු පත්කිරීම.
- නව අධ්‍යක්ෂ මණ්ඩලයක් පත් කර ගැනීම.
- නව අධ්‍යක්ෂ මණ්ඩලය දිවුරුම් දීම.
- නව අධ්‍යක්ෂ මණ්ඩලය අසුන් ගැනීම
- සාමාජික අදහස් සහ යෝජනා ඉදිරිපත් කිරීම.
- නව සභාපතිවරයාගේ ආමන්ත්‍රණය.
- විධායක අධ්‍යක්ෂවරයාගේ ස්තුති කතාව.
- විසිර යාම.

මහා සභා රැස්වීම සඳහා ඉදිරිපත් කිරීමට ඇති ඔබගේ යෝජනා 2017 ජූලි මස 16 වන දිනට පෙර විධායක අධ්‍යක්ෂ, ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය, 170, කොලොන්නාව පාර, දෙමටගොඩ යන ලිපිනයට ලැබෙන්නට සලස්වන්න. ඔබගේ පැමිණීම 2017 ජූලි මස 16 වන දිනට පෙර 0714 894 848/ 0718229204/ 071 8106680 අංකයක් අමතා තහවුරු කිරීම සංවිධාන කාර්යයට පහසුවකි.

u; l fkä c ,s23 bßo¡fõ" Wfoa09 g" "

# 18 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනය 2017
## 18TH INTERNATIONAL EXHIBITION OF PHOTOGRAPHY

## ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය



ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ 18 වන ජාත්‍යන්තර ඡායාරූප තරගය සහ ප්‍රදර්ශනය 2017 සැප්තැම්බර් මස 15/16/17 යන තෙදින පැවැත්වීමට කටයුතු සූදානම් කරමින් පවතී.

---

FIAP, PSA හා GPU යන ජාත්‍යන්තර ආයතනයන්ගේ ප්‍රදර්ශන අනුග්‍රහය යටතේ විවෘත ඒක වර්ණ, විවෘත වර්ණ සොබාදහම සහ සංචරණ ලෙස තරග අංශ 04 ක් ඔස්සේ පැවැත්වේ.

---

කෘතීන් භාරගන්න අවසන් දිනය අගෝස්තු මස 25 වේ. ඉල්ලුම්පත් ඉදිරියේ දී අන්තර්ජාලයෙන් සහ ඉරුදින පන්තියෙන් ලබා ගත හැක.

ජාත්‍යන්තරය ජයගන්න.. ඔබත් රූ එකතුවට සූදානම් වන්න..

- **විවෘත ඒක වර්ණ**
- **විවෘත වර්ණ**
- **සොබාදහම**
- **සංචරණ**

**කෘතීන් භාර ගන්නා අවසන් දිනය - අගෝස්තු 25**

විමසීම :
අධ්‍යක්ෂ ප්‍රදර්ශන,
නාරද අමරතුංග
0712 791026 | 0770335426

මෙවර 18 වන ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශනයේ තේරීම් කමිටුව සඳහා විදේශීය ප්‍රවීණයන් දෙපළකගේ ද සහය ලැබීම සුවිශේෂී කරුණකි. එම දෙපළ ද ඇතුළුව ජාත්‍යන්තරය ජයගත් ලාංකීය ප්‍රවීණයන් සිව් දෙනෙකුගෙන් යුත් තේරීම් කමිටුවක් සහභාගීවීමට නියමිත ය.

---

## LNPAS ANPAS FNPAS අයදුම් කිරීම

ඡායාරූප ශිල්පීන් නිර්මාණ කුසලතා සහ ශාස්ත්‍රීය දක්ෂතා අගයමින් සංගමය මගින් පිරිනමන ඉහත සඳහන් සම්මාන මෙම පරීක්ෂණය සඳහා අයදුම් කළ හැකි අවසන් දිනය ජූලි මස 15 වේ. පරි/ 007/ 004 අංක දරන චක්‍රලේඛයේ ප්‍රතිපාදන පරිදි මේ සඳහා ඉල්ලුම් කළ හැකි ය.

(මෙම චක්‍රලේඛයේ අත්‍යවශ්‍ය කරුණු ඇතුළත් උපුටනය 2016 ජූලි/අගෝස්තු පිළිසඳර කලාපයෙන් ඔබ වෙත එවා ඇත.) අවශ්‍ය වැඩිමනක් විමසුම් වේ නම්, ගරු ලේඛකාධිකාරී උපනන්ද සෙනෙවිරත්න මහතා (071 4901200) අමතන්න.

# අධ්‍යාපන පුවත්



## කැලණි විහාර
### ඡායාරූප වැඩමුළුව - 2017

**වාර්ෂිකව පැවැත්වෙන කැලණි විහාර ඡායාරූප වැඩමුළුව මෙවර ජූනි මස 11 වන දින පැවැත්විණි. කැලණි විහාර ඡායාරූප තරගයෙන් ඒකවර්ණ ප්‍රථම ස්ථානය සඳහා පිරිනැමෙන එල්. බී. එස්. එස්. බාලසූරිය ශූරතා පලිහ මෙවර ද පිරිනැමීමට නියමිත ය. මේ සඳහා තෙවසරේ ම විද්‍යාර්ථයින් සහභාගී වූ අතර අපගේ සම්මානීය ජ්‍යෙෂ්ඨයින් වන චන්ද්‍රසේන පෙරේරා, ඩී. කේ. ලැන්ටි, එල්. බී. එස්. එස්. බාලසූරිය, ප්‍රියන්ත අමරසිංහ, ඉඳුනිල් මුණසිංහ යන මහත්වරුන්ගේ සම්පත් දායකත්වය නොමසුරුව ලැබුණි. එමෙන්ම වැඩමුළුව සඳහා කැලණි විහාර පූජාභූමිය ලබාදුන් අතිපූජ්‍ය මහාචාර්ය කොල්ලුපිටියේ මහින්ද සංඝරක්ඛිත මහනායක හිමිපාණන් ද ස්තූති පූර්වකව සිහිපත් කරමු.**

---

## පසුගිය 03 වන ඉරිදා කතිකාවන්

3RD SUNDAY වන ඉරිදාව

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ ඡායාරූප ඩිප්ලෝමාව අවසන්කර නික්මුණු සහෘද ඔබ හා ඡායාරූප ශිල්පය හා ලැදි සංගමයේ ජ්‍යෙෂ්ඨ සහෘදයින් වෙනුවෙන්. සෑම මසකම තෙවන සති අන්ත පැවැත්වෙන ඉරිදා දින සුහද අධ්‍යාපනික කතිකාවතේ පසුගිය කතිකාවන් ලෙස 'මතුගමින් එතෙරට' බන්දු ගුණරත්න මහතා සමග මැයි 21 වන ඉරුදින සහ පී. යූ. ඩී. පෙරේරා මහතා සමග ජූනි මස 18 වන ඉරුදින මහාබෝධි විද්‍යාලයේ දී පවත්වන්නට යෙදුණි.











# දෙවන වසරේ හෝර්ටන් තැන්න වැඩමුළුව





මෙවර දෙවන වසර විද්‍යාර්ථයින් සඳහා අධ්‍යක්‍ෂ මණ්ඩලය සහ එක්ව දෙවන වසර පන්ති සම්බන්ධීකාරකවරුන් වන ප්‍රේමසිරි හිඳැල්ලආරච්චි සහ සාලිය ලියනගේ යන මහත්වරුන් සංවිධානය කර තිබූ හෝර්ටන් තැන්න වැඩමුළුව භූමි දර්ශන ඡායාරූපකරණය මූලික කර ගනිමින් සාර්ථකව ජූනි මස 03, 04 යන දෙදින පැවැත්වුණි.

මෙහි දී භූමි දර්ශන ඡායාරූපකරණය පිළිබඳව වර්තමානයේ සිටින දක්‍ෂතම ඡායාරූප ශිල්පියෙකු වන ප්‍රියන්ත බණ්ඩාර මහතාගේ සම්පත් දායකත්වය හිමි වූ අතර, වනජීවී දෙපාර්තමේන්තුව සම්බන්ධීකරණය ඇතුළුව වැඩමුළුවේ සංවිධාන කර්තව්‍යයන් සඳහා සංගමයේ හිටපු අධ්‍යාපන අධ්‍යක්‍ෂවරයෙකු වන රෝහිත ගුණවර්ධන මහතාගේ දායකත්වය ලැබුණි.

මෙහි දී හෝර්ටන් තැන්න පිළිබඳව හඳුන්වාදීමේ දේශනය සමග දින දෙක පුරා සියලු පහසුකම් සමග හෝර්ටන් තැන්න අසිරිය අත්විඳීමට අවකාශය ලබාදුන් උද්‍යාන භාරකරු වන පියල් රවීන්ද්‍ර මහතා මෙහි දී සිහිපත් කළ යුතු ය.

---

# ඕනෑකර තිබේ...






**01.** සංගමයේ බඩු බාහිරාදිය සුරක්ෂිතව පවත්වාගැනීම සඳහා අගුලු දැමිය හැකි උස අඩි 4 කට නොවැඩි තනි පියනේ වානේ කබඩ් එකක්.

**02.** මල්ටිමීඩියා යන්ත්‍ර සමඟ පංතිකාමර පාඩම්වල දී භාවිතය සඳහා 6'' x 4'' ප්‍රමාණයට නොවැඩි ප්‍රක්ෂේපන තිර දෙකක්. (එකක තිරය රඳවන Stand එක ද තිබේ නම් සුදුසු ය).

**03.** දේශන සඳහා පරිහරණය කළ හැකි ලැප්ටොප් යන්ත්‍රයක් (පාවිච්චි කරන ලද 14'' ප්‍රමාණයේ තිරයක් සහිත එකක් වුවද ගැටලුවක් නොමැත).

**04.** පන්ති කාමරයේ භාවිතා කළ හැකි මේස විදුලි පංකාවක්. (පාවිච්චි කරන ලද එකක් වුවද භාවිතයට සුදුසු නම් ගැටලුවක් නොමැත)

*මෙම භාණ්ඩයන් ලබා දීමට පහසු ක්‍රමවේදයක් ඔබ සතුව පවතී නම් හෝ ඔබගේ හිතමිත්‍ර සම්බන්ධතා ඔස්සේ ලබාගත හැකි නම් අමතන්න තුෂාරට (0714 89 48 48) හෝ උදිතට (0718 10 66 80)*

---

# ඉක්මන් වුනොත් පමණයි..!

සාමාජික ඔබ වෙනුවෙන් සම්පාදනය කළ පහත සඳහන් දේ ස්වල්ප ප්‍රමාණයක් ඉතිරි ව ඇත. ඉක්මනින් ලබාගතහොත් පසුවට පසුතැවිලි විය යුතු නොවේ.

1. සුදු, අළු ටී-ෂර්ට්
2. Felicitation NPAS ග්‍රන්ථය
3. Photography - My Note Book
4. සංගමයේ ෆයිල් කවර
5. සංගමයේ මුද්‍රිත පෑන්




ඔබගේ අවශ්‍යතාවන් සඳහා විමසන්න සංවර්ධන අධ්‍යක්‍ෂ තුෂාර සමරකෝන් මහතා (071 4894848)

# සමාජ සේවා පුවත්

## *ගං දියට බිලි නොවූ මනුසත්කම...*

*පසුගිය දා ඇතිවූ ගංවතුර ආපදා තත්වයෙන් අවතැන් වූ අපගේ සහෝදර පිරිස් සඳහා ආධාර උපකාර කිරීමට අප සංගමයේ ක්‍රියාකාරීන් කිහිපදෙනෙකු සමාජ සේවා සංවිධානයක් වන 'වන් හෝප්' සමඟ අත්වැල් බැඳගත්හ. ඔවුන් එක්ව බියගම මල්වාන, කඩුවෙල බෝමිරිය ප්‍රදේශවල අවතැන් වූ පවුල් බොහොමයක් සඳහා වියළි ආහාර පාර්සල්, ඇඳුම් සහ සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබා දීමට කටයුතු කළහ.*






## ශාන්ත ගුණරත්නයන් හට සෝනි Alpha 7II කැමරාවක්






සෝනි ආයතනය මගින් සංවිධානය කර තිබූ Sony World Photography Awards ඡායාරූප තරගාවලියේ ලාංකීය තරගයෙන් දෙවන ස්ථානය හිමිකර ගැනීමට අප සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජික ශාන්ත ගුණරත්න මහතාගේ 'Goldsmith 2' ඡායාරූපය සමත්විය.

ශාන්ත ගුණරත්නයන් විසින් දෙවන ස්ථානය සඳහා පිරිනමන සෝනි Alpha 7II කැමරාව ත්‍යාග ලෙස හිමිකර ගත්හ.

මෙහි පළමු ස්ථානය අප සාමාජික නිශාන්ත මංජුල මහතා සහ තෙවන ස්ථානය විමුක්ති ඇඹුල්දෙණිය මහතා විසින් ලබාගැනීමට සමත් වී ඇත.

## චන්ද්‍රසේන පෙරේරා හට FIAP , PSA රන් සම්මාන



'Inquisitive Kids'- FIAP Gold





'Performence'- FIAP Gold



'Return Journey'- PSA Gold

ජාත්‍යන්තර සම්මානලාභී ප්‍රවීණ ඡායාරූප කලාවේදී චන්ද්‍රසේන පෙරේරා මහතා පසුගිය දා FIAP රන් සම්මාන ද්විත්වයකින් සහ PSA රන් සම්මානයෙන් පිදුම් ලැබීය.

මැසිඩෝනියාවේ පැවැති Kumanovo Photo Salon තරගාවලියෙන් 'Inquisitive Kids' නැමැති ඡායාරූපය සඳහා FIAP රන් සම්මානයක් ද ප්‍රංශයේ පැවැති Riedisheim Photo Salon International තරගාවලියෙන් 'Performence' නැමැති ඡායාරූපය සඳහා FIAP රන් සම්මානයක් සහ අයර්ලන්තයේ පැවැති Ireland Photo Salon තරගාවලියෙන් 'Return Journey' නැමැති ඡායාරූපය සඳහා PSA රන් සම්මානයක් ද හිමිකර ගැනීමට සමත් විය.



ජපානය මගින් පවත්වනු ලබන Asahi Shimbun ජාත්‍යන්තර ඡායාරූප තරගයෙන් Honorable Mention සම්මානයක් හිමිකර ගැනීමට චන්ද්‍රසේන පෙරේරා මහතා සමත් වී තිබේ. මෙය ඔහු Asahi Shimbun මගින් Honorable Mention සම්මානයක් හිමිකර ගත් සිව්වන අවස්ථාවයි. මෙවර සම්මානය හිමි වී ඇත්තේ ඔහුගේ 'Her Glance' නමැති ඡායාරූපයට ය.

## නිරෝගී සුව ප්‍රාර්ථනා

*ඩින්ටන් ජයසූරිය මහතා*

අසනීප තත්ත්වයෙන් පසුවන සංගමයේ හිටපු විධායක අධ්‍යක්ෂ ඩින්ටන් ජයසූරිය සූරීන්ට ඉක්මන් නිරෝගී සුවය ප්‍රාර්ථනා කරමු.

*දී. ග. සෝමපාල මහතා*

ටික කලක පටන් අසනීප ව නිවසේ පසුවන සංගමයේ හිටපු ප්‍රදර්ශන අධ්‍යක්ෂවරයෙකු වන දී. ග. සෝමපාල කලාවේදියාණන්ට කඩිනමින් නිරෝගී සුවය ප්‍රාර්ථනා කරමු.

## ඉන්ද්‍රනාථ තේනුවරයන්ගේ සඳාත්මය




ඉන්ද්‍රනාථ තේනුවර මහතාගේ "සඳාත්මය" පර්යේෂණාත්මක චන්ද්‍රාලෝක ඡායාරූප ප්‍රදර්ශනය පසුගිය ජුනි මස 10, 11, 12 යන තෙදින කොළඹ 07, ජේ. ඩී. ඒ. පෙරේරා කලාගාරයේ දී සාර්ථකව පැවැත්වුණි.

## 'Discover Mannar' දෙවන තැන කුශාන් විමුක්ති හට








EU-Sri Lanka සංවර්ධන සහයෝගීතාවත් සමඟ PSSL, IFC ආයතනයන් එක්ව පසුගිය දා පැවැති 'Discover Mannar' ඡායාරූප තරගයේ විවෘත අංශයේ දෙවන ස්ථානය හිමිකර ගැනීමට අප සංගමයේ තෙවන වසර විද්‍යාර්ථියෙකු වන කුශාන් විමුක්ති සමත් වූයේය.

මෙහි දී දෙවන ස්ථානයට පිරිනමන ත්‍යාගය වන රු. 50,000 මුදල් චෙක්පත සහ සහතිකය ඔහුට හිමිවිය. ජයග්‍රාහී ඡායාරූපය 'Light of the Family' ලෙස නම් කර තිබුණි.

## ඒ.ඩී-ශාන්ත-සුනිල් දිවයිනට සැපැත් වෙති

*ඒ. ඩී. ධර්මසේන*

සංගමයේ ජ්‍යෙෂ්ඨ සාමාජිකයෙකු මෙන් ම පළමු අධ්‍යක්ෂ මණ්ඩලයේ ප්‍රබල ක්‍රියාකාරිකයෙකු වූ ඒ. ඩී. ධර්මසේන මහතා දීර්ඝ කාලයක් විදෙස්ගතව සිට දැන් නැවතත් දිවයිනට පැමිණ සිටී. ඒ පිළිබඳ සංගමයේ බලවත් සතුට පළකරන අතර ඒ මහතාට දීර්ඝායුෂ හා නිරෝගී සුව ප්‍රාර්ථනා කරමු.



*ශාන්ත වීරසිංහ*

කලක් ශ්‍රී ලංකාවේ කීර්තිමත් ඡායාරූප ශිල්පියකු, ජාත්‍යන්තර ඡායාරූප ප්‍රදර්ශන ලේකම්වරයෙකු මෙන් ම සංගමයේ සියලු කාර්යයන්හි දී ඊට නායකත්වය, ශක්තිය, ධෛර්‍යය ලබා දුන් ශාන්ත වීරසිංහ මහතා මේ දිනවල ලක්දිවට සැපත් වී සිටී. සංගමය වෙනුවෙන් එතුමන්ගෙන් ලත් ශක්තිය කෘතවේදී ව සිහිපත් කරන්නෙමු.



*සුනිල් ලියනගේ*

පසුගිය දශක තුන පුරා සංගමයේ පැවැත්ම සඳහා අප්‍රමාණ වෙහෙස මහන්සියකින් කැපවූ කටයුතු කළ සුනිල් ලියනගේ මහතා දැන් යළි අප සමග එක් වී සිටී. ඉදිරියේ දී පෙර මෙන් ම සංගමය වෙනුවෙන් කැපවී කටයුතු කරන්නට එතුමන්ට ශක්තිය ධෛර්‍යය, චිර ජීවනය ප්‍රාර්ථනා කරමු.

ඔබේ තොරතුරුත් අපේ විත්තියට කියන්න - 0716 450 871/ kmanujith@gmail.com

# ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමය
# The National Photographic Art Society of Sri Lanka

## මධ්‍යස්ථාන පරිපාලනය පිළිබඳ විධිවිධාන

**අරමුණු**

ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ මධ්‍යස්ථානය සහ ඊට සම්බන්ධ පරිශ්‍රය, සංගමයේ සහ දේශයේ අභිවෘද්ධිය උදෙසා මනා කළමනාකරණයකින් යුතු ව පවත්වාගැනීමට විධිවිධාන පැනවීම මෙම චක්‍රලේඛයෙන් අරමුණු කෙරේ.

**අර්ථ නිරූපණය**

සංගමයේ කාර්යයන් සඳහා මධ්‍යස්ථානය ලෙස භාවිත කරනු ලබන පරිශ්‍රයේ කාර්යයන් සහ ක්‍රියාත්මක ස්වරූපය මෙයින් පැහැදිලි කරන අතර, සංගමයේ ප්‍රධාන පරිපාලන කාර්යාලය මෙම පරිශ්‍රය තුළ හෝ ඉන් බැහැර පවත්වාගෙන යා හැකි ය. එසේ සංගමයේ ප්‍රධාන කාර්යාලය පිටත ස්ථානයක ක්‍රියාත්මක වන්නේ නම්, මධ්‍යස්ථානය තුළ මෙහෙයුම් කාර්යාලයක්/මැදිරියක් ක්‍රියාත්මක කෙරේ.

**නාමකරණය**

සංගමයේ මධ්‍යස්ථානය "ජාතික ඡායාරූප ශිල්ප මධ්‍යස්ථානය" (The National Centre of Photography) ලෙස නම් කෙරේ.

**මධ්‍යස්ථානයේ ක්‍රියාත්මක අංශ**

1. මෙහෙයුම් කාර්යාලය
2. කලු සුදු ඡායාරූප රසායනාගාරය
3. ඡායාරූප චිත්‍රාගාරය
4. ප්‍රතිබිම්බ කලා පුස්තකාලය
5. ඡායාරූප ශිල්ප කෞතුකාගාරය
6. බඩු ගබඩාව

මෙයට අමතර ව මධ්‍යස්ථාන නිලධාරිගේ නවාතැන සහ සාමාජික සුබසාධන පරිශ්‍රයක් ද මේ තුළ පවත්වාගෙන යනු ලැබේ.

**මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ අරමුණු**

1. සංගමයේ කළමනාකරණ කටයුතු මනාව පවත්වාගෙන යාම
2. ඡායාරූප ශිල්ප අධ්‍යයන කාර්යයන් මැනවින් ඉටුකරලීම
3. වෘත්තීය අංශයේ වැඩසටහන් සංවිධානය
4. පාසල් අංශයේ වැඩසටහන් සංවිධානය
5. කාන්තා අංශයේ වැඩසටහන් සංවිධානය
6. ප්‍රකාශන අංශයේ වැඩසටහන් සංවිධානය
7. ප්‍රදර්ශන අංශයේ වැඩසටහන් සංවිධානය
8. සමාජසේවා අංශයේ වැඩසටහන් සංවිධානය
9. සංගමයේ භාණ්ඩාගාරය/ද්‍රව්‍ය ආරක්ෂිත ව නඩත්තු කිරීම
10. සාමාජික සහජීවන මධ්‍යස්ථානයක් පවත්වා ගැනීම

ඉහත කරුණුවලට අමතර ව සංගමයේ ව්‍යවස්ථාවට අනුකූල වන සහ එහි අභිවෘද්ධියට තුඩුදෙන වෙනත් ව්‍යාපෘති, වැඩමුළු, ප්‍රදර්ශන යනාදී කාර්යයන් ඉටුකරලීම මධ්‍යස්ථානය පවත්වාගෙන යාමේ අරමුණු වෙයි.

**භාරකාරත්වය**


මධ්‍යස්ථානය පිළිබඳ පරිපාලන වශයෙන් ප්‍රතිපත්තිමය මෙන් ම අවස්ථානුකූල තීරණ තීන්දු ගැනීම ද, දෛනික විධිවිධාන සැලසුම් කිරීම ද අධ්‍යක්ෂ මණ්ඩලය සතු වගකීමක් වන අතර, භාරකාරත්වයේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතු ය. එහි ක්‍රියාත්මක කාර්යභාරය අධ්‍යක්ෂ මණ්ඩලයේ අභිමතයට යටත් ව සංවර්ධන හා ප්‍රවර්ධන අධ්‍යක්ෂවරයාට සහ සමාජ සේවා අධ්‍යක්ෂවරයාට පැවරේ. මධ්‍යස්ථානයේ දෛනික කටයුතු පවත්වාගෙන යාමට මධ්‍යස්ථාන නිලධාරියෙකු පත්කිරීම ද, ඒ පිළිබඳ වගකීම මනාව ඉටුකරලීම ද යථෝක්ත අධ්‍යක්ෂවරුන්ට භාර වේ. එසේ ම මධ්‍යස්ථානයේ ගිණුම් කටයුතු පිළිබඳ වගකීම සංවර්ධන හා ප්‍රවර්ධන අධ්‍යක්ෂවරයා විසින් දැරිය යුතු ය.

**නිර්දේශ**

නිර්දේශ 10 ක් යටතේ යථාවත් කාර්ය සම්පාදනය අරමුණු කොටගෙන ඊට අදාළ කරුණු මේ යටතේ සවිස්තරාත්මකව දක්වා ඇත.

# සංවර්ධන පුවත්

# ගොඩනැගිලි අරමුදලට අපිත් දායකවෙමු



ශ්‍රී ලංකා ජාතික ඡායාරූප කලා සංගමයේ මූලස්ථානය සඳහා අරමුදල් සම්පාදනය පිළිබඳ ඉදිරිපත් වූ යෝජනා මූලස්ථාන ප්‍රතිෂ්ඨාපන කමිටුවේ අවධානයට බඳුන් කරන ලදුව, ඔරොත්තු දෙන ගෙවීම් ක්‍රමවේදයකට අනුව සංගමය වෙත මුදල් ලබා දීමට හැකි වැඩ පිළිවෙළක් යෝජනා කෙරිණි. ඒ අනුව පහත සඳහන් ගෙවීම් ක්‍රම තුනට යටත් ව රු. 12000/= ක මුදලක් සපයා දීමෙන් ඒ සඳහා මේ මොහොතේ අත්‍යවශ්‍ය ම වන ඔබේ දායකත්වය සංගමය වෙත ලබා දෙන ලෙස මහත් කාරුණික ව ඉල්ලා සිටිමු.

මේ සඳහා වන ඔබේ පරිත්‍යාගය, ජාතික ඉතිරි කිරීමේ බැංකුවේ ප්‍රධාන ශාඛාවේ 100010100838 අංක දරණ ශ්‍රී ලංකා ජාතික ඡායාරූප සංගමයේ ගොඩනැගිලි අරමුදල් ගිණුමට බැර කළ හැකි ය. නොඑසේ නම් එය ගරු මුදල් අධ්‍යක්ෂතුමිය වෙත මුදලින් ලබා දිය හැකි ය.

## ගෙවීමේ ක්‍රම විධි



**01.** එකවර රු. 12000 ක මුදල පරිත්‍යාග කිරීම.

**02.** 2016 දෙසැම්බර් 31 දිනට පෙර රු. 6000 ක මුදලක් සහ 2017 දෙසැම්බර් 31 ට පෙර ඉතිරි රු. 6000 ක මුදල පරිත්‍යාග කිරීම.

**03.** මසකට රු. 1000 බැගින් මාස 12 ක කාලයක් අඛණ්ඩව සංගමය වෙත මුදල් පරිත්‍යාග කිරීම.

ඉහත කවර හෝ ක්‍රමයකට අනුව රු.12000 ක මුදල් ගෙවා සම්පූර්ණ කිරීමෙන් පසු ඔබගේ එකී අපරිමිත සහයෝගය හා ආශීර්වාදයට උපහාරයක් ලෙසින්, මූලස්ථාන ස්වර්ණ මුද්‍රිකාවක් සහ සහතික පත්‍රයක් ඔබ වෙත ගෞරව බහුමානයෙන් ප්‍රදානය කරන්නට අධ්‍යක්ෂ මණ්ඩලය බලාපොරොත්තු වේ.

මෙලෙස මූලස්ථාන ව්‍යාපෘතියට දායකත්වය එක්කරන්නට සංගමයේ සාමාජික සාමාජිකාවන් රැසක් දැනටමත් ඉදිරිපත් වී සිටිති. සාමාජික ඔබ මෙන් ම සංගමයේ ඉදිරි ගමනට ආශිර්වාද කරන බාහිර පරිත්‍යාගශීලී හිතවතුන් හා පින් කැමති අයගේ දායකත්වය ද මූලස්ථාන ව්‍යාපෘතිය සාර්ථක කරගැනීම පිණිස වන මහත් උපකාරයකි. අප සංගමයේ සාමාජිකයකු නොවූවද අපට උදව් කරන්නට කැමති ඔබේ හිතවතුන් ද මේ සඳහා සම්බන්ධ කරදෙන මෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිමු.




### මූලස්ථාන ස්වර්ණ මුද්‍රිකාලාභීන්

1. මංගල එදිරිසිංහ මහතා
2. එල්. බී. එස්. එස්. බාලසූරිය මහතා
3. ටී. පී. සුනිල් වික්‍රම මහතා
4. උ. ග. ගුණසේකර මහතා
5. සා. අ. 1931
6. ටී. එස්. ටී. සිල්වා මහතා
7. නිරෝෂ් වරුසවිතාන මහතා
8. නිහාල් අබේරත්න මහතා
9. විජය බස්නායක මහතා
10. වින්ද්‍යා බස්නායක මෙනවිය
11. ශ්‍රී ලංකා තෙවන ඇස ඡායාරූප හා මාධ්‍ය ශිල්පී සංගමය, හලාවත
12. ජී. හෙට්ටිආරච්චි මහතා
13. මර්වින් එස්. ගුණවර්ධන මහතා
14. ඩී. සෙනෙවිරත්න මහතා
15. උපනන්ද සෙනෙවිරත්න මහතා


ශ්‍රී ලංකා ජාතික ඡායාරූප සංගමයේ මූලස්ථානය ගොඩනැගීමේ කාර්යය සඳහා මෙතෙක් රුපියල් 12,000 ට වැඩි මුදල් ආධාර ලබාදුන් භවතුන්ගේ නම් ඉහත සඳහන් ය. සංගමයේ ගෞරවනීය දායකත්වය සම්බන්ධයෙන් ගෞරවය හා ස්තුතිය පිරිනමමු.

# අපගේ ශෝකය

- සංගමයේ ක්‍රියාකාරී සාමාජික දෙවන වසර පන්ති සම්බන්ධීකාරක ප්‍රේමසිරි හිඳැල්ලආරච්චි මහතාගේ දයාබර පියාණන් අභාවප්‍රාප්ත වූ බව දැනුම් දෙනුයේ ඉතාමත් සංවේගයෙන් යුතුව ය.
- සංගමයේ සාමාජික චන්දු ගුණරත්න මහතාගේ දයාබර මිත්තණියගේ අභාවය දැනුම් දෙනුයේ ඉතාමත් සංවේගයෙන් යුතුවය.

# ජයග්‍රහණ

## මාසික තරග ජයග්‍රහණ (2017 අප්‍රේල් 02)



■ ඒක වර්ණ
01. ජී. පී. එන්. අබයරත්න
02. මොහාන් ගුරුසිංහ
03. කුෂාන් විමුක්ති
04. ධනංජය චතුරංග
05. ලක්ෂාන් මාපා




■ වර්ණ
01. ගගන් කරුණාචන්ද්‍ර
02. ධනංජය චතුරංග
03. සුරේෂ් වීරසිංහ
04. භානු දිසානායක
05. ගගන් කරුණාචන්ද්‍ර

*ඡායාරූප තේරීම් කමිටුව - යමුනි රශ්මිකා මිය | විරාජ් ලියනාරච්චි මහතා*

## මාසික තරග ජයග්‍රහණ - (2017 ජූනි 04) විහාරමහාදේවි උද්‍යාන වැඩමුළුව



*බී. පී. වීරවර්ධන ශූරතාව*
*මොහාන් ගුරුසිංහ*

■ ඒක වර්ණ
01. මොහාන් ගුරුසිංහ
02. ජගත් සූරියප්පෙරුම
03. අමානි ඉරේෂිකා
04. ජීවන්ත ගුණසේකර
05. අමානි ඉරේෂිකා



■ වර්ණ
01. මොහාන් ගුරුසිංහ
02. සමීර මධුෂංඛ
03. ගිම්හාන් ජයසිංහ
04. මොහාන් ගුරුසිංහ
05. මොහාන් ගුරුසිංහ

*ඡායාරූප තේරීම් කමිටුව - බන්දු ගුණරත්න මහතා | චන්ද්‍රසේන පෙරේරා මහතා*
*ප්‍රියන්ත අමරසිංහ මහතා*

*මාසික තරග සංවිධායක කමිටුව - මධුරංග අබේවර්ධන (0773 549 449)*
*ශෙහාන් ප්‍රනාන්දු | මනිල්ක ජයසිංහ | හේමමාලි අල්විස්*

# ප්‍රකාශන පුවත්

## ඉදිරියට ඔබට පිළිසඳර අවශ්‍ය... මුද්‍රිතව ද? විද්‍යුත් තැපෑලෙන් ද?

මුද්‍රණ හා තැපැල් වියදම්වල ඉහළ යාමත්, බොහෝ සාමාජික භවතුන් අන්තර්ජාල සංනිවේදන කාර්යයන් සඳහා වැඩි ලැදියාවක් දැක්වීමත් හේතුවෙන් ඔබේ අවශ්‍යතාව මත පමණක් ඉදිරියේ දී පිළිසඳර මුද්‍රිත ප්‍රකාශයක් ලෙස නිකුත් කිරීමට ගරු අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කොට ඇත. එබැවින් ඉදිරි පිළිසඳර සංගමයේ වෙබ් අඩවියෙන් (www.npaslanka.org) වෙතින් හෝ පිළිසඳර ෆේස්බුක් පිටුව මගින් මෙන් ම සංගමයේ නිල ෆේස්බුක් සමූහය වන 'අපි NPAS' සමූහය තුළින් ද ලබාගත හැකි ය. එසේ වුවද ඔබ විසින් ඉදිරියට ද පිළිසඳර මුද්‍රිත ප්‍රකාශය පුරුදු ලෙස ම තැපැල් මගින් ගෙන්වාගැනීමට අවශ්‍ය නම් ඊට ද කිසිදු බාධාවක් නොමැත.


එබැවින් ඉදිරියේ දී පිළිසඳර **මුද්‍රිත ප්‍රකාශනය අවශ්‍ය අය** මෙතෙක් ඒ පිළිබඳව දැනුම් දී නොමැති නම් ප්‍රකාශන අධ්‍යක්ෂ මනුජිත් කටුගම්පොළ මහතාට (0766 450 693) දුරකථන ඇමතුමක් ලබා දී ඔබගේ ලිපිනය හා සාමාජික තොරතුරු ලබාදීමට කාරුණික වන්න.

## පිළිසඳර ඔබ අතට එන්නේ මෙහෙමයි...

ද්විමාසික සඟරාවක් ලෙස සංගමය මගින් මුද්‍රණය වන පිළිසඳර සංග්‍රහය දයාබර සාමාජික භවතුන් හට තැපෑල මගින් තම නිවාසයන්ට ලැබීම දක්වා වූ ක්‍රියාවලියේ මුද්‍රණයෙන් පසු තැපෑල වෙත සූදානම් කිරීමේ ක්‍රියාවලිය සම්ප්‍රදායක් ලෙස කෙරෙනුයේ සංගමයේ සාමාජික විද්‍යාර්ථයින් හා ප්‍රකාශන කමිටුවේ මැදිහත් වීම මත ය. එසේ සූදානම් කිරීමේ ක්‍රියාවලිය බොහෝ විට පුරා දවසක් ගතවන්නකි. මේ එම එක් අවස්ථාවක් වන පසුගිය පිළිසඳර ඔබ අතට පත්වීමට මත්තෙන් ඒ සඳහා වෙහෙසෙන හිතවතුන්ගේ මතකයයි.


මෙම ක්‍රියාවලියට පෙර සහ පසු කාර්යයන්හි වත්මන් කමිටු සාමාජිකයින් ලෙස යතුරුලියන කාර්යයන් සඳහා මධුෂිකා ලක්මාලි, මින්දූරි අබේසේකර සහ දිනෙත් චතුරංග සහය වන අතර තැපැල් දෙපාර්තමේන්තුවේ අපේ සගයා ලෙස චමින්ද වීරසිංහ එම සියලු කාර්යයන් සම්බන්ධීකරණය කරනු ලබයි.











### පිළිසඳරට වෙහෙස මහන්සිය

ප්‍රකාශන අධ්‍යක්ෂ - මනුජිත් කටුගම්පොළ

පිළිසඳර **ප්‍රකාශන අනුකමිටුව**

1 වසර: රශේන්ද්‍ර ඩිල්ෂාන්/ක්‍රිෂාන් ගීතික/නදීර ඩිල්ෂාන්/ බිනර ආසිරි/ තිලානි ශානිකා/අර්ජුන සුමින්ද/ ගීතිකා නිසංසලා/අසංග මුණසිංහ
2 වසර: මධුෂිකා ලක්මාලි/දිනෙත් ප්‍රනාන්දු/චමින්ද වීරසිංහ/ ගිහාන් දූල්වල/මින්දුරී අබේසේකර
3 වසර: ආර්. එම්. මඩවල/මදුෂිකා ලක්මාලි/පියෝරි නිරන්ජන්